**උඩුනුවර ප්‍රාදේශීය සභාව - 2023**

**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

උඩුනුවර ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට උඩුනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණන සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතී, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදිකර තිබෙන ඉඩම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුළ දී සභාවේ ගොඩනැගිලි දෙකක් අළුත්වැඩියා කිරීමට වැය කළ රු.3,975,287 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2024 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරන බව | ඉඩම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවා ඇණවුමක් ඉදිරිපත් කිරීමකින් තොරව රු.600,000 ක් වියදම් හර කර ණයහිමියන් යටතේ දෝෂ සහගතව ගිණුම්ගත කර තිබුණි. | - එම - | ගිවිසුමක් හෝ බැඳීමක් සහිතව ගිණුම්ගත කළ යුතුය |
| (ඇ) | ඉකුත් වර්ෂයට අදාළව ලැබිය යුතු රු.21,394,150 ක මුද්දර ගාස්තු දෙවරක්, මුද්දර ගාස්තු ගිණුමට ගැලපීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂය අවසාන දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.21,394,150 ක් වැඩියෙන් දක්වා තිබුණි. | - එම - | ආදායම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දී ටෙන්ඩර් කර ලබා දුන් කඩ කාමරයකට අදාළව ලැබී තිබුණු රු.1,446,550 ක එක්වන් මුදල, ආදායමට බැර නොකර එක්වන් මුදල් පාලන ගිණුමට බැර කිරීම හේතුවෙන් ලැබිය යුතු එක්වන් මුදල් හා වර්ෂයේ ආදායම අඩුවෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයේ එක්වන් මුදල් ආදායම වන රු.1,446,550 ක මුදල එක්වන් මුදල් පාලන ගිණුම යටතේ ගිණුම්ගත කර ඇති බව | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය |
| (ඉ) | ඉකුත් වර්ෂවලට අදාළව සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට ගෙවූ රු.937,584 ක හිඟ දායකත්ව මුදල සමාලෝචිත වර්ෂයේ වියදමක් සේ සලකා ගිණුම්ගත කිරීම හේතුවෙන්, වර්ෂයේ වියදම එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේ දී නැවත එවැනි වැරදි සිදු නොවීමට වග බලා ගන්නා බව | ඉකුත් වර්ෂවල වියදම් සමුච්චිත අරමුදලට ගැලපිය යුතුය |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ ගෙලිඔය පොදු වෙළඳ පොලේ කඩ කාමර 13 කින් ලැබිය යුතු එක්වන් මුදල් හඳුනා ගෙන ගිණුම්ගත කර තිබිය දී, සමාලෝචිත වර්ෂයට අදාළ එක්වන් මුදල් වාරිකය රු.977,664 ක් ලැබීම නැවත එක්වන් මුදල් පාලන ගිණුම හර කර ආදායමට | 2023 වර්ෂයේ එක්වන් මුදල් ආදායම වන රු.2,993,824 ක මුදල එක්වන් මුදල් පාලන ගිණුම යටතේ ගිණුම්ගත කර ඇති බව | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |

බැර කිරීමෙන් එම අගයෙන් ලැබිය යුතු එක්වන් මුදල් හා ආදායම වැඩිපුර දක්වා තිබුණි.

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් පාලන දායක විශ්‍රාම වැටුප් අරමුදලට වර්ෂය අවසාන දිනට රු.12,087 ක් වැඩිපුර ගෙවා තිබුණ ද, මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ශේෂය ලෙස රු.581,643 ක් දක්වා තිබීම හේතුවෙන්, රු.593,730 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය. | 2024 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරන බව | නොසැසඳීම් හඳුනා ගෙන ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය |

### 1.6.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| | අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විධිමත් අනුමැතියක් ලබා ගැනීමකින් තොරව ආදායම් විෂයයන් 04 ක රු.7,689,649 ක මුදලක් අවසන් ගිණුමේ ශේෂය සහ උපලේඛන අනුව ශේෂයන් ගැලපීම සඳහා යනුවෙන් දක්වා ගිණුම්වලින් කපා හැර තිබුණි. | කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කර අදාළ අනුමැතිය ලබා ගෙන ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව | විධිමත් අනුමැතියක් ලබා ගෙන ගිණුම් ශේෂ නිරවුල් කළ යුතුය |
| (ආ) | ගෙලිඔය පොදු වෙළඳ පොළේ අංක 19 කඩ කාමරයෙන් ලැබිය යුතු කඩ කුලී හිලව් කිරීම සඳහා දෝෂ සහගතව රු.151,200 ක් එක්වන් මුදල් පාලන ගිණුමෙන් හා රු.199,260 ක් කඩ කුලී තැන්පතු ගිණුමෙන් කපා හැර තිබුණි. | 2024 වර්ෂයේ නිවැරදි කරන බව | තැන්පතු ගිණුමෙන් ගැළපිය යුතු කඩ කුලී නිවැරදිව ගැලපීමට කටයුතු කළ යුතුය |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දී කර්මාන්ත ණයගැතියෝ රු.7,362,767 ක මුදලක් හා රු.1,290,555 ක කර්මාන්ත ණයහිමි මුදලක් අනුමැතියකින් තොරව කපා හැර තිබුණි. | ලේඛන පරීක්ෂා කර හඳුනා ගෙන නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම් ශේෂ හඳුනා ගෙන නිරවුල් කළ යුතුය |

### 1.6.4 අවිනිශ්චිත ගිණුම්

| විෂය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.46,226 ක අවිනිශ්චිත ගිණුමේ ශේෂය සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. සිදු වූ වරද නිශ්චිතව හඳුනා නොගෙන සමාලෝචිත වර්ෂයේ දී, ජ'නල් සටහන් මඟින් අවිනිශ්චිත ගිණුමට රු.365,838 ක් හර හා රු.10,254 ක් බැර කර තිබුණි. | අඩුපාඩු හඳුනා ගෙන අවිනිශ්චිත ගිණුම නිරවුල් කරන බව | ගිණුම් ශේෂයන්ගේ සිදු වී ඇති වැරදි හඳුනා ගෙන නිවැරදි කළ යුතුය |

### 1.6.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.306,245 ක වත්කම් විෂයයන් 02 කට අදාළව ලේඛන හා උපලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, විගණනයේ දී ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | 2024 වර්ෂයේ දී ගිණුමට නිවැරදි තොරතුරු ඇතුළත් කිරීමට කටයුතු කරන බව | ගිණුම් ශේෂ සනාථ කර ගැනීමට අවශ්‍ය උපලේඛන නිවැරදිව පවත්වා ගෙන යා යුතුය |

### 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | | | |
| (i) | 19(1)(xii) ඡේදය | විෂයය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව ගෙලිඔය පොදු වෙළඳ පොළේ කඩ කාමර 19 ක් 2022 වර්ෂයේ දී වසර 30 ක් සඳහා බදු දී තිබුණි. | විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීමට ලිපි යොමු කරන ලද බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (ii) | 127 වගන්තිය | සභාව විසින් භාවිතයට ගනු ලබන සුසාන භූමි 87 ක් පිහිටි ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව | සභා බල ප්‍රදේශයේ පිහිටි සුසාන භූමිවල අයිතිය පවරා ගැනිමට කටයුතු කළ යුතුය |
| (ආ) | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| | 2020 ඔක්තෝබර් 16 දිනැති අංක 18/2020 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා ආයතන සංග්‍රහයේ I වැනි බාණ්ඩයේ XIV වැනි පරිච්ඡේදයේ 4.1 හා 4.1.1 | තම සේවා අවශ්‍යතා අනුව, පෞද්ගලිකව සම්පූර්ණ කර ගත යුතු රාජ්‍ය භාෂා ප්‍රවීණතා පාඨමාලාවට සහභාගී වූ නිලධාරීන් හත් දෙනෙකුට රු.95,576 ක ගමන් වියදම් හා සංයුක්ත දීමනා ගෙවා තිබුණි. | අදාළ නිලධාරීන්ගෙන් අය කර ඒ බව දැනුම් දීමට කටයුතු කරන බව | ආයතන සංග්‍රහයේ උපදෙස් හා චක්‍රලේඛවලට අනුව කටයුතු කළ යුතුය |

(ඇ) **පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ**

| | | | | |
|---|---|---|---|---|
| (i) | 2016 මාර්තු 17 දිනැති අංක 2016/03 දරන චක්‍රලේඛයේ VI ඡේදය | ටෙන්ඩර් කිරීමකින් තොරව කඩ කාමර 02 ක් බදු දී තිබුණි. | පෙන්වා දී ඇති කරුණ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට කටයුතු කරන බව | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (ii) | 2016 මාර්තු 17 දිනැති අංක 2016/03 දරන චක්‍රලේඛයේ 12 වන වගන්තිය | සභාවේ ලිඛිත අවසරය නොමැතිව කඩ කාමරවලට අලුතින් කොටස් එකතු කිරීම, ස්වරූපය වෙනස් කිරීම සිදු කළ නොහැකි වුවත්, ගෙලිඔය වෙළඳ සංකීර්ණයේ අංක 03 හා 04 කඩ කාමර දෙක ඒකාබද්ධ කර එක් කඩ කාමරයක් ලෙස සකස් කර තිබුණි. | අදහස් දක්වා නොමැත | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (iii) | 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරන නාගරික සංවර්ධන අධිකාරියේ සැලැසුම් හා සංවර්ධන නියෝග/ රෙගුලාසිවල 02 වන උපලේඛනය හා 1982 අංක 04 හා 1984 අංක 44 දරන පනත්වලින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 28 අ(3) වගන්තිය | ගොඩනැගිලි සැලැසුම අනුමත කර ගත් ගොඩනැගිලි 05 ක් අනුමත සැලැස්මට අනුකූල නොවී ඉදිකිරීම් සිදු කර තිබුණ ද, නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ගොනු පසු විපරම් කර නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව | නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.18,591,301 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.48,739,458 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තුගත ආදායම | 2023 බිල් කළ ආදායම | 2023 රැස් කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තුගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස් කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 12,925,000 | 11,880,628 | 13,118,345 | 34,141,333 | 13,156,000 | 12,978,577 | 9,803,046 | 35,615,728 |
| (ii) | කුලී | 5,417,073 | 6,868,774 | 12,626,544 | 14,897,784 | 3,770,000 | 32,184,265 | 13,747,785 | 18,729,330 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,909,100 | 3,564,412 | 3,564,412 | -- | 2,450,000 | 2,989,008 | 2,702,508 | 994,300 |
| (iv) | වෙනත් ආදායම් | 54,961,100 | 43,051,101 | 83,098,985 | 105,048,056 | 22,114,750 | 52,309,537 | 88,717,013 | 37,053,107 |
| | එකතුව | 76,212,273 | 65,364,915 | 112,408,286 | 154,087,173 | 41,490,750 | 100,461,387 | 114,970,352 | 92,392,465 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් සම්බන්ධව ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති තොරතුරු හා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති තොරතුරු සමඟ නොසැසඳෙන බැවින්, ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය පිළිබඳව අදහස් දැක්වීමට නොහැකි විය. | ප්‍රධාන ආදායම් මූලාශ්‍ර මූල්‍ය ප්‍රකාශනය අනුව සැසදෙන බව ද, පසුගිය වර්ෂ වලට අදාල ලේඛන සමඟ සමාලෝචිත වර්ෂයේ ලේඛන පරික්ෂා කර මෙම වර්ෂයේදී අදාළ නොසැසඳීම් නිවැරදි කිරීමට කටයුතු කරන බව | එක් එක් ආදායම් ලේඛන හා ගිණුම් ශේෂ සසඳා නිවැරදි කළ යුතුය |
| (ආ) | **වරිපනම් හා බදු** | | |
| (i) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තියේ විධිවිධාන අනුගමනය කිරීමකින් තොරව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඒකකයක මුළු හිඟ මුදල රු.20,000 ක් ඉක්ම වූ වසර 05 ට වඩා වැඩි කාලයක සිට පැවත එන පෞද්ගලික දේපළ 132 කින් හිඟ හිටි වරිපනම් බදු රු.4,668,738 ක් අය කර ගෙන නොතිබුණි. | ඉදිරියේදී හිඟ වරිපනම් අය කිරීමට කටයුතු කරන බව | හිඟ වරිපනම් බදු අය කර ගත යුතුය |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 05 ට වඩා වැඩි කාලයක සිට රාජ්‍ය ආයතන 03 ක වරිපනම් ඒකක 168 ක හිඟ හිටි වරිපනම් රු.682,299 ක් අය කර ගෙන නොතිබුණි. | ප්‍රාදේශිය සභා පනත ප්‍රකාරව කටයුතු කර හිඟ වරිපනම් බදු අය කර ගැනීමට කටයුතු කරන බව | රාජ්‍ය ආයතනවලින් හිඟ හිටි වරිපනම් බදු අය කර ගත යුතුය |
| (ඇ) | **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.1,504,073 ක් හා මුද්දර ගාස්තු රු.93,760,075 ක් විය. | ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වලින් මුද්දර ගාස්තු උපලේඛන නිවැරදි කිරීම සිදු කිරීම මත මුද්දර ගාස්තු හිඟ ශේෂය වෙනස් වන බව | හිඟ ආදායම් ගෙන්වා ගත යුතුය |

## 2.3 අධිභාර

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂයන් තුල පැන වූ අධිභාර සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,085,636 ක මුදලක් අයකර ගැනීමට තිබුණි. | අභියාචනා පරීක්ෂණය අවසන් කර එය පළාත් පාලන අමාත්‍යාංශයට යොමු කිරීමෙන් අනතුරුව ලැබෙන නියෝග මත ඉදිරි අය කර ගැනීම් සිදු කරන බව | අධිභාර අය කර ගැනීමට කටයුතු කළ යුතුය |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කායර්යන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 සිට 95 දක්වා වගන්තිවලට අනුව, මළ ප්‍රවාහනය සහ කසළ ශෝධනය ප්‍රාදේශීය සභාව විසින් ඉටු කළ යුතු වුවත්, ගලි රථයක් සපයා ගැනීමට හා මළ පිරිපහදු ඒකකයක් ආරම්භ කිරීමට සභාවේ අවධානය යොමු වී නොතිබුණි. | ඉදිරි ක්‍රියාත්මක සැලැස්මට මෙම යෝජනාව ඇතුළත් කිරීමට කටයුතු කරන බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය |
| (ආ) | 1987 අගෝස්තු 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 119 වගන්තිය ප්‍රකාරව සභාව විසින් සති පොළක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේදී ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සමඟ සම්බන්ධ වීධිමත්ව සති පොළක් ආරම්භ කිරීමට කටයුතු කරන බව | පනතින් දක්වා ඇති කාර්යයන් ඉටු කළ යුතුය |

### 3.2 කළමනාකරණ අකායර්ක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති ලැබිය යුතු ගිණුම් ශේෂ 06 ක එකතුව රු.133,991,591 ක් විය. ඉන් වසර 01 ත් වසර 05 ත් අතර කාල පරාසයක එකතුව රු.102,846,795 ක් හා වසර 05 ක් ඉක්මවා තිබුණු ශේෂවල එකතුව රු.28,014,684 ක් ද අය කර නොතිබුණි. | අදාළ හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කරන බව | ලැබිය යුතු ගිණුම් ශේෂ අය කර ගත යුතුය |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රාදේශීය සභාව විසින් දෛනික පදනම මත සේවයේ යොදවා ගන්නා ලද සේවකයින් 07 දෙනෙකු වෙනුවෙන් 2020 මාර්තු සිට 2022 මැයි දක්වා රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදලට සේවකයාගෙන් අය කළ යුතු රු.336,821 ක් සභා අරමුදලින් ගෙවීම් කර සභා අරමුදලට පාඩුවක් සිදු කර තිබුණි. එසේ ගෙවන ලද මුදල් රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු වුවත්, කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදලට මෙම මුදල් ප්‍රේෂණය කර තිබුණි. | මේ සඳහා නිසි උපදෙස් නොලැබීම සහ කම්කරු දෙපාර්තමේන්තුවෙන් කරන ලද දැනුවත් කිරීම මත මෙම මුදල් ගෙවීමට සිදු වූ බව | නීති, රීති අනුව අදාළ ආයතනයට ගෙවිය යුතුය |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ රු.1,989,935 ක් වැය කර පුමුණුව පිත්තල කර්මාන්ත ශාලාව ඉදිකර තිබුණ ද, අපේක්ෂිත අරමුණ සඳහා යොදවා ගෙන නොතිබුණි. | තක්සේරු වාර්තාව ලද පසු මෙම ගොඩනැගිල්ල බදු ලබා දිම සඳහා ටෙන්ඩර් කර ලබා දිමට කටයුතු යොදා ඇති බව | ගොඩනැගිල්ල අරමුණුගත කාර්යයට යොදවා ගත යුතුය |

3.3 **නිෂ්කායර් හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු එකතුව රු.23,152,179 ක වාහන 09 කින්, එක් වාහනයක් වසරකට වැඩි කාලයක් හා අනෙකුත් වාහන 08 වර්ෂ 03 කට වඩා වැඩි කාලයක සිට නිෂ්ක්‍රීයව හා ගර්හිතව පැවතුණි. | රජයේ තක්සේරුව ගෙන්වා ගැනීමෙන් අනතුරුව වෙන්දේසි කළ යුතු වාහන වෙන්දේසි කිරීමටත් භාවිතයට ගත හැකි වාහන අළුත්වැඩියා කිරීමටත් කටයුතු කරන බව | අදාළ ක්‍රියාමාර්ග කඩිනමින් අවසන් කළ යුතුය |

3.4 **වත්කම් කළමනාකරණය**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව පරිහරණය කරන ඉඩම් හා ගොඩනැගිලි 80 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව විසින් භාවිතයට ගනු ලබන රජයේ ඉඩම්වල ඇති සුසාන භූමි පවරා ගැනිමේ කටයුතු කරන බව | සභාව සතු ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගත යුතුය |
| (ආ) | නළ ළිං ගබඩාවේ එකතුව රු.424,463 ක චලනය නොවන ශේෂයක් පවතින අතර, එම තොගය භාවිතයට ගැනීමට හෝ වෙනත් ප්‍රයෝජනයකට ගත හැකි ආයතනයකට ලබා දීමට හෝ කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී නළ ළිං කාර්මිකයෙකු බඳවා ගත් පසු නළ ළිං අලුත්වැඩියා කටයුතු සඳහා ගබඩාව තුළ පවතින ද්‍රව්‍ය අවශ්‍ය බැවින්, එම තොග තව දුරටත් පවත්වා ගෙන යන බව | තොගය භාවිතයට ගැනීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතුය |
| (ඇ) | කිරි වවුල මානෙල් අංග කසළ කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටි අක්කර 01, රූඩ් 01, පර්චස් 25.69 ක ඉඩමේ නීත්‍යානුකූල අයිතිය පවරා ගෙන නොතිබුණි. | ඉඩම පවරා ගැනිමේ කටයුතු සිදු කරමින් පවතින බව | ඉඩම පවරා ගැනීමට කටයුතු කළ යුතුය |

### 3.5 ව්‍යාපෘති, කතර්ව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේ ඉදිකිරීමට සැලැසුම් කර තිබුණු එකතුව රු.11,485,000 ක සංවර්ධන ව්‍යාපෘති 07 ක් සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට ව්‍යාපෘතිය ඉටු නොකර අත්හැර දමා තිබුණි. | මාර්ග ලියාපදිංචි නොකිරීම, අධික වර්ෂාව හා සමිති ව්‍යාපෘති ඉටු නොකිරීම වැනි හේතු මත ව්‍යාපෘති ඉටු කර නොමැති බව | සැලැසුම්ගත කාර්යයන් ඉටු කළ යුතුය |

### 3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සභා අරමුදල් මගින් වේගිරිය නාථ දේවාලයේ සිට කිරිගල අම්බලම පාර කාණු පද්ධතිය සංවර්ධනය සඳහා ඇස්තමේන්තුවක් පිළියෙල කර උඩුනුවර ග්‍රාම සංවර්ධන සමිතිය සමඟ රු.1,350,000 කට ඉදිකිරීම් පවරා වැඩ නිම කර, රු.1,341,162 ක් ගෙවා තිබුණි. ලිපිගොනුව පරීක්ෂාවේ දී, වැඩ විෂය අංක 08 මගින් මිලි මීටර් 25 සැටරින් ලෑලි (Form Work) යෙදීම මාර්ග පිළිබඳ සම්මත මිල විග්‍රහය අනුව කාණු පද්ධති ඉදිකිරීමේ දී, රු.1,030 ක ST 112 රේටය භාවිතා කළ යුතු වුවත්, HSR හි ST 64 රේටය වන රු.2,025 ක් යොදා ගැනීම හේතුවෙන් වර්ග මීටර් 88 ක් සඳහා රු.87,560 ක මුදලක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | රඳවුම් මුදලින් සිදු වූ අලාභය අය කර ගැනීමට කටයුතු කරන බව | අදාළ රේට භාවිතා නොකර ගෙවීම් නිර්දේශ කළ නිලධාරීන් හඳුනා ගෙන ක්‍රියාමාර්ග ගත යුතුය |

### 3.7 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| අනුමත කාර්ය මණ්ඩලය තථ්‍ය කාර්ය මණ්ඩලය සමඟ සැසඳීමේ දී තනතුරු 02 ක පුරප්පාඩු 20 ක් හා ඒක් තනතුරක අතිරික්තතා 14 ක් පැවතුණි. | අතිරික්ත නිලධාරීන් රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත එම බඳවා ගැනීම් සිදු කර ඇති බව | පුරප්පාඩු සම්පූර්ණ කරවා ගත යුතුය |
| **(ආ) සේවක ණය** | | |
| ස්ථාන මාරු කරන ලද, විශ්‍රාම ගිය සහ විවිධ හේතුන් මත ගෙවීම් පැහැර හැර ඇති නිලධාරීන් 20 දෙනෙකුගෙන් 2019 වර්ෂයේ සිට දීර්ඝකාලීනව හිඟව පවතින රු.1,490,831 ක ණය ශේෂ අය කර නොතිබුණි. | පෙර වර්ෂවල සේවක ණය ලේඛනවල පැවති ගැටළුකාරී තත්වයන් හේතුවෙන්, ඒවා නිවැරදි කර කටයුතු කිරීමට සිදු කරන බවත්, ණය ශේෂ අය කිරීමට කටයුතු කරන බව | සභාවට අය විය යුතු සේවක ණය අය කර ගත යුතුය |

4. **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**අභ්‍යන්තර විගණනය**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| සභාවේ අභ්‍යන්තර විගණනය සම්බන්ධ රාජකාරී නිලධාරීන් දෙදෙනකු වෙත පවරා තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂය තුළ දී, අභ්‍යන්තර විගණන වාර්තා 03 ක් පමණක් නිකුත් කර තිබුණි. ඒ අනුව, වර්ෂය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු වී නොමැති බව නිරීක්ෂණය විය. | මේ සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන නිලධාරින් දැනුවත් කර ඇති බව | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කිරිමට කටයුතු කළ යුතුය |